# සතිපතා ආර්ථික දර්ශක

2020 ජූලි 17



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

සංචරණ සඳහා පනවා තිබූ සීමාවන් සම්පූර්ණයෙන්ම ලිහිල් කිරීමත් සමග, රටේ ආර්ථික ක්‍රියාකාරකම් යථාවත් වීම හේතුකොටගෙන, 2020 ජූනි මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පිළිවෙළින්, දර්ශකාංක 18.0 කින් ඉහළ යමින් 67.3 දක්වා හා දර්ශකාංක 7.3 කින් ඉහළ යමින් 50.4 දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය.

2020 මැයි මාසයේ කාර්මික නිෂ්පාදන දර්ශකය, 2019 මැයි මාසයට සාපේක්ෂව 79.0 දක්වා සියයට 25.5 කින් පහළ යන ලදී. නිෂ්පාදන කර්මාන්තයන්හි ප්‍රධාන උප කාණ්ඩයන් සැලකීමේ දී, "රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන" (සියයට -70.0) සහ "ඇඟලුම් නිෂ්පාදන" (සියයට -58.7) යන කාණ්ඩයන්හි නිෂ්පාදන පහළ යෑම සමස්ත දර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

සලකා බලන කාලපරිච්ඡේදය (2020.07.11 සිට 2020.07.17 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ඔපෙක් සංවිධානය ඇතුළු ඛනිජ තෙල් නිපදවන රටවල් අගෝස්තු මස සිට සිය නිමැවුම් සීමා කිරීම් ලිහිල් කිරීමට එකඟ වීමෙන් පසුව සැපයුම ඉහළ යෑමට ඇති විභවතාව හමුවේ මිල ගණන් පහළ ගියේය. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ බොරතෙල් සංචිත තියුණු ලෙස අඩු වීම හේතුකොටගෙන සතිය මැද භාගයේ දී මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සමස්තයක් ලෙස මෙම කාල සීමාව තුළ දී බ්‍රෙන්ට් මිල සහ ඩබ්ලිව්.ටී.අයි. මිල, පිළිවෙලින් බැරලයකට එ.ජ. ඩොලර් 0.41 කින් සහ බැරලයකට එ.ජ. ඩොලර් 0.51 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2020 ජූලි මස 17 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 16 කින් සියයට 7.95 ක් දක්වා පහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 166.675 ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 158.842 ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2020 ජූලි මස 17 වන දින වනවිට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.08 කින් 4,988.50 දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.62 කින් 2,153.50 දක්වා ඉහළ ගියේය.

## විදේශීය අංශය

2020 වසරේ ජූලි මස 17 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.2 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් රුපියල, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 2.1 කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 3.0 කින් අතිප්‍රමාණය වූ අතර, යුරෝවලට සාපේක්ෂව සියයට 3.7 කින් සහ ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 3.5 කින් අවප්‍රමාණය විය.

2020 වසරේ පළමු මාස පහ තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,519 ක් දක්වා සියයට 28.4 කින් පහත වැටුණු අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (සියයට -31.7), තේ (සියයට -20.1) සහ රබර් නිෂ්පාදිත (සියයට -25.7) අපනයන ආදායම පහත වැටීම හේතු විය. 2020 වසරේ පළමු මාස පහ තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,619 ක් දක්වා සියයට 19.2 කින් පහත වැටුණු අතර, ඉන්ධන (සියයට -34.0), රෙදිපිළි හා රෙදිපිළි උපාංග (සියයට -23.8) සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ (සියයට -20.1) ආනයන පහත වැටීම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2020 වසරේ පළමු මාස පහ තුළ දී වෙළඳ හිඟය 2019 වසරේ පළමු මාස පහ තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,281 සිට එ.ජ. ඩොලර් මිලියන 3,100 ක් දක්වා අඩු විය.

සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ මැයි මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 14.8 කින් ඉහළ ගියේය. 2020 වසරේ මැයි මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.8 කින් පහත වැටුණු අතර මේ සඳහා පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2020 වසරේ මැයි මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 104.4 ක් දක්වා සියයට 20.6 කින් ඉහළ ගියේය .

තේ සඳහා සාමාන්‍ය මිල (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2019 වසරේ මැයි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.05 සිට 2020 වසරේ මැයි මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.75 ක් දක්වා ඉහළ ගියේය.
2020 වසරේ මැයි මාසයේ දී තිරිඟු සහ බොර තෙල් සඳහා වූ ආනයන මිල ගණන් 2019 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව, පිළිවෙලින්, සියයට 5.5 කින් හා සියයට 66.0 කින් පහත වැටුණු අතර සහල් හා සීනි ආනයන මිල ගණන් පිළිවෙලින් සියයට 41.4 කින් හා සියයට 13.7 කින් ඉහළ ගියේය.

# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | මැයි 2020 | මාසයකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 135.4 | 134.8 | 128.7 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.4 | (0.3) | 1.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 5.2 | 5.1 | 2.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 5.2 | 5.9 | 3.5 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 137.9 | 136.9 | 133.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.8 | 5.0 | 4.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.7 | 3.2 | 6.3 |
| **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100)** | **ජූනි 2020** | **මාසයකට පෙර** | **වසරකට පෙර** |
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 135.3 | 134.2 | 130.2 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.8 | 0.4 | 0.9 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.7 | 4.7 | 4.2 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.9 | 4.0 | 3.8 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 138.6 | 138.1 | 134.4 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 4.2 | 4.4 | 4.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.1 | 2.9 | 5.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව







## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 96.20 | 96.00 | 96.00 | 80.00 | 98.00 | 98.00 | 97.60 | 85.00 |
| රතු කැකුළු | 90.00 | 90.00 | 90.20 | 68.50 | 93.00 | 93.00 | 93.00 | 75.00 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 150.00 | 87.00 | 118.00 | 77.50 | 200.00 | 122.00 | 156.00 | 112.50 |
| ගෝවා | 65.00 | 58.00 | 80.00 | 40.00 | 110.00 | 99.00 | 140.00 | 67.50 |
| කැරට් | 84.00 | 100.00 | 127.00 | 125.00 | 126.00 | 132.00 | 163.00 | 155.00 |
| තක්කාලි | 83.00 | 133.00 | 139.00 | 56.25 | 112.00 | 167.00 | 182.00 | 88.75 |
| වට්ටක්කා | 40.00 | 30.00 | 30.00 | 110.00 | 75.00 | 55.00 | 57.00 | 150.00 |
| පතෝල | 73.00 | 75.00 | 108.00 | 67.50 | 116.00 | 118.00 | 148.00 | 115.00 |
| වම්බටු | 50.00 | 54.00 | 111.00 | 70.00 | 80.00 | 92.00 | 150.00 | 105.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 160.00 | 180.00 | 275.00 | 145.00 | 200.00 | 216.00 | 310.00 | 175.00 |
| ලොකු ළූණු (ආනයනික) | 65.10 | 58.00 | 63.20 | 102.50 | 83.00 | 76.00 | 79.00 | 120.00 |
| අර්තාපල් (දේශීය) | 207.00 | 150.00 | 171.00 | 168.75 | 229.00 | 190.00 | 200.00 | 197.50 |
| වියළි මිරිස් (ආනයනික) | 390.00 | 390.00 | 400.00 | 292.50 | 420.00 | 420.00 | 440.00 | 345.00 |
| පරිප්පු (ඉන්දියානු) | 140.00 | 140.00 | 141.00 | 110.00 | 150.00 | 150.00 | 150.00 | 120.00 |
| බිත්තර (සුදු) | 19.00 | 19.00 | 18.00 | 18.00 | 20.00 | 20.00 | 19.00 | 19.00 |
| පොල් (ගෙඩියක මිල) | ලැනො. | ලැනො. | 62.00 | 30.00 | 60.00 | 61.00 | 77.50 | 40.25 |
| අමු මිරිස් | 200.00 | 145.00 | 147.00 | 380.00 | 266.00 | 190.00 | 188.00 | 465.00 |
| දෙහි | 300.00 | 305.00 | 430.00 | 237.50 | 360.00 | 375.00 | 515.00 | 287.50 |
| **මාළු (අ)** | | | | | | | | |
| කෙලවල්ලා | 606.00 | 536.00 | 520.00 | 627.50 | 906.00 | 822.00 | 836.00 | 827.50 |
| බලයා | 378.00 | 348.00 | 362.00 | 353.33 | 478.00 | 448.00 | 462.00 | 450.00 |
| සාලයා | 252.00 | 224.00 | 234.00 | 220.00 | 296.00 | 272.00 | 288.00 | 267.50 |
| හුරුල්ලා | 540.00 | 483.33 | 510.00 | 377.50 | 636.00 | 583.33 | 610.00 | 477.50 |

(අ) පෑලියගොඩ ධීවර වෙළඳපොළෙන් රැස් කරන ලද මිල ගණන්.

ලැනො. - ලැබී නොමැත.

## පිටකොටුව වෙළඳපොළ- සිල්ලර මිල (අ)



















### 1.2.2 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සාමාන්‍ය මිල ගණන් - මෙම සතිය | |
|---|---|---|
| | තොග මිල | සිල්ලර මිල |
| **සහල්** | | |
| සම්බා | 96.00 | 98.00 |
| රතු කැකුළු | 90.00 | 92.00 |
| **එළවළු** | | |
| බෝංචි | 114.00 | 133.00 |
| ගෝවා | 60.20 | 80.10 |
| කැරට් | 111.00 | 131.00 |
| තක්කාලි | 61.70 | 81.80 |
| වට්ටක්කා | 40.30 | 60.30 |
| පතෝල | 42.80 | 62.80 |
| වම්බටු | 71.80 | 91.80 |
| අළු කෙසෙල් | 73.10 | 93.10 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 137.70 | 147.70 |
| ලොකු ළූණු (දේශීය) | 65.10 | 75.10 |
| අර්තාපල් (දේශීය) | 205.17 | 215.17 |
| වියළි මිරිස් (ආනයනික) | 391.80 | 399.80 |
| පොල් (ගෙඩියක මිල) | 53.40 | 58.60 |

### 1.2.4 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 93.40 | 93.70 | 94.60 | 82.00 |
| සුදු කැකුළු | 87.50 | 87.60 | 89.00 | 74.50 |
| රතු කැකුළු | 89.70 | 90.60 | 90.50 | 69.13 |
| නාඩු | 86.80 | 87.30 | 92.30 | 78.50 |

### 1.2.3 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 98.00 | 98.00 |
| රතු කැකුළු | 93.00 | 93.00 |
| **එළවළු** | | |
| බෝංචි | 160.00 | 152.00 |
| ගෝවා | 148.00 | 140.00 |
| කැරට් | 144.00 | 176.00 |
| තක්කාලි | 140.00 | 156.00 |
| වට්ටක්කා | 88.00 | 96.00 |
| පතෝල | 140.00 | 140.00 |
| වම්බටු | 120.00 | 108.00 |
| අළු කෙසෙල් | 148.00 | 156.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 240.00 | 313.33 |
| ලොකු ළූණු (ආනයනික) | 88.00 | 82.00 |
| අර්තාපල් (දේශීය) | 232.00 | 208.00 |
| අර්තාපල් (ආනයනික) | 132.00 | 132.00 |
| වියළි මිරිස් (ආනයනික) | 516.00 | 500.00 |
| පරිප්පු | 160.00 | 160.00 |
| සුදු සීනි | 135.00 | 135.00 |
| බිත්තර (සුදු) (ඒකක මිල) | 20.00 | 20.00 |
| පොල් (ගෙඩියක මිල) | 70.00 | 74.50 |
| අමු මිරිස් | 288.00 | 252.00 |
| **මාළු** | | |
| කෙලවල්ලා | 922.00 | 864.00 |
| බලයා | 600.00 | 446.00 |
| සාලයා | 354.00 | 286.00 |
| හුරුල්ලා | 664.00 | 714.00 |

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව ) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | සිව්වන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2018 (අ)(ආ) | 2019 (අ) | 2018 (අ)(ආ) | 2019 (අ) |
| කෘෂිකාර්මික | 6.5 | 0.6 | 8.2 | (4.1) |
| කාර්මික | 1.2 | 2.7 | (3.4) | 1.4 |
| සේවා | 4.6 | 2.3 | 4.2 | 2.7 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | (0.6) | 2.6 | (0.4) | 3.4 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **3.3** | **2.3** | **1.9** | **2.0** |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2020 ජන.-අප්‍රේ (අ) | 2019 ජන.-අප්‍රේ (ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ. මිලියන) | 73.4 | 96.8 | (24.2) |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 24.8 | 28.6 | (13.4) |
| පොල් | (ගෙඩි මිලියන) | 885.2 | 1,036.7 | (14.6) |

(අ) තාවකාලික (ආ) සංශෝධිත




## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | මැයි | | % වෙනස |
|---|---|---|---|
| | 2019 (ආ) | 2020 (ඇ) | |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **106.1** | **79.0** | **(25.5)** |
| ආහාර නිෂ්පාදන | 108.9 | 114.4 | 5.0 |
| ඇඟලුම් නිෂ්පාදන | 117.2 | 48.4 | (58.7) |
| අනෙකුත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 114.0 | 68.3 | (40.1) |
| පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන | 64.8 | 91.7 | 41.4 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 105.3 | 31.6 | (70.0) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 113.8 | 69.7 | (38.8) |
| පාන වර්ග | 103.4 | 53.6 | (48.1) |

(අ) ප්‍රධාන උප අංශ 7

(ආ) සංශෝධිත (ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජුනි 2020 | මැයි 2020 | ජුනි 2019 | මැයි 2019 | ජුනි 2020 | මැයි 2020 | ජුනි 2019 | මැයි 2019 |
| දර්ශකය | 67.3 | 49.3 | 53.9 | 50.7 | 50.4 | 43.1 | 53.1 | 44.7 |







## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2020 මැයි | 2019 මැයි | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2012 = 100) | 114.6 | 101.4 | 13.0 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) | 182.4 | 179.3 | 1.7 |
| කෘෂිකර්මාන්ත | 197.2 | 185.1 | 6.5 |
| කර්මාන්ත | 184.5 | 181.9 | 1.4 |
| සේවා | 174.1 | 174.3 | (0.1) |



### 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2019 පළමු කාර්තුව | 2020 පළමු කාර්තුව (ආ) | 2019 වාර්ෂික (ආ) |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 52.6 | 51.0 | 52.3 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 5.7 | 4.8 |
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ඇ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 24.7 | 26.5 | 25.3 |
| කර්මාන්ත | 28.3 | 27.1 | 27.6 |
| සේවා | 47.1 | 46.4 | 47.1 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි.

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව







### 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2019 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2019 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2019 ලං.ඛ.නී.සං. ආනයන මිල (සි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) | 2020 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2020 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2020 ලං.ඛ.නී.සං. ආනයන මිල (සි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 59.63 | 51.13 | 62.80 | 64.28 | 58.28 | 70.44 |
| පෙබරවාරි | 64.23 | 54.84 | 68.65 | 55.86 | 51.04 | 63.68 |
| මාර්තු | 66.97 | 58.08 | 70.97 | 34.63 | 31.42 | 37.67 |
| අප්‍රේල් | 71.45 | 63.76 | 75.59 | 26.46 | 19.03 | 19.56 |
| මැයි | 70.49 | 61.09 | 74.76 | 32.28 | 28.41 | 25.44 |
| ජූනි | 62.88 | 54.57 | 67.29 | 40.43 | 37.89 | |
| ජූලි | 64.31 | 57.61 | 68.73 | | | |
| අගෝස්තු | 59.76 | 55.10 | 64.78 | | | |
| සැප්තැම්බර් | 62.53 | 57.20 | 67.73 | | | |
| ඔක්තෝබර් | 59.54 | 53.98 | 66.06 | | | |
| නොවැම්බර් | 62.49 | 57.00 | 69.11 | | | |
| දෙසැම්බර් | 64.87 | 59.54 | 71.78 | | | |
| **දිනය** | **2019** | | | **2020** | | |
| ජූලි 11 | 67.05 | 60.60 | | - | - | |
| ජූලි 12 | 66.90 | 60.51 | | - | - | |
| ජූලි 13 | - | - | | 42.93 | 40.24 | |
| ජූලි 14 | - | - | | 41.92 | 39.21 | |
| ජූලි 15 | 66.56 | 60.04 | | 43.03 | 40.42 | |
| ජූලි 16 | 64.35 | 57.62 | | 43.75 | 41.09 | |
| ජූලි 17 | 64.59 | 57.67 | | 43.34 | 40.75 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ.

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික

| අයිතමය | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 4.50 | 4.50 | 7.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 5.50 | 5.50 | 8.50 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල්අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 4.53 | 5.12 | 7.83 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික** | | | |
| දින 91 | 4.65 | 5.08 | 7.99 |
| දින 182 | 4.75 | 5.18 | 8.09 |
| දින 364 | 4.91 | 5.32 | 8.46 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 7.95 | 8.11 | 10.97 |
| | 2020 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.20-7.50 | 0.20-7.50 | 0.20-7.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 2.50-15.00 | 3.00-15.00 | 4.00-15.00 |
| | 2020 ජූනි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 7.38 | 7.57 | 8.94 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 9.00 | 9.26 | 11.07 |
| | 2020 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 7.83 | 7.83 | 10.05 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 7.96 | 7.88 | 10.38 |
| | 2020 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 12.96 | 13.08 | 14.48 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 11.68 | 11.67 | 14.67 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2020 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 4.00 | 4.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 8.75 | 8.75 | 10.50 |

* දත්ත 2020 ජූනි 30 දිනට වේ. 2020 පෙබරවාරි 24 දින සිදුකරන ලද නිවේදනය අනුව, 2020 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතික ප්‍රකාශයට පත් කිරීම නවතාලන ලදී.

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02 මාස 05<br>2020 ජූලි 13 | වසර 05 මාස 07<br>2020 ජූලි 13 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 7.90 | 9.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 5.47 | 6.57 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 8.27 | 8.90 | එච්එස්බීසී බැංකුව | 6.73 | 6.63 |
| මහජන බැංකුව | 8.11 | 9.15 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 7.91 | 8.33 |
| හැටන් නැෂනල් බැංකුව | 8.03 | 8.73 | සිටි බැංකුව | 7.77 | 9.20 |
| කොමර්ෂල් බැංකුව | 7.96 | 8.05 | ඩොයිෂ් බැංකුව | 7.65 | 7.49 |
| සම්පත් බැංකුව | 10.18 | 8.44 | හබීබ් බැංකුව (අ) | 8.78 | 8.78 |
| සෙලාන් බැංකුව | 8.90 | 8.60 | ඉන්දියන් බැංකුව | 9.59 | 9.59 |
| යුනියන් බැංකුව | 9.82 | 10.07 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 9.78 | 9.78 |
| පැන් ඒෂියා බැංකුව | 11.00 | 12.90 | එම්සීබී බැංකුව | 9.50 | 10.08 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව | 7.78 | 9.06 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 7.16 | 7.63 |
| ඩීඑෆ්සීසී බැංකුව | 8.54 | 8.63 | පබ්ලික් බැංකුව (අ) | 8.90 | 8.90 |
| එන්ඩීබී බැංකුව | 8.43 | 8.49 | අයිසීඅයිසීඅයි බැංකුව (ආ) | - | - |
| අමානා බැංකුව (අ) | 9.15 | 9.15 | ඇක්සිස් බැංකුව (ආ) | - | - |
| කාර්ගිල්ස් බැංකුව (අ) | 11.81 | 11.81 | | | |

(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇක්සිස් බැන්ක් ලිමිටඩ් සහ අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාවේ සිදු කරන ව්‍යාපාර කටයුතු වසා දැමීමට, අදාළ බැංකුවල මව් සමාගම් විසින් සිදු කළ ඉල්ලීම් මුල් කරගෙන, කොන්දේසිවලට යටත්ව, අවසර ලබාදී ඇත. ඒ අනුව, මේ වන විට, මෙම බැංකුවලට මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමද ඇතුලත්ව, බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා අවසර නොමැත. මෙම බැංකු වෙත ලබාදී ඇති බලපත්‍ර, මෙරට ඔවුන්ගේ බැංකු ව්‍යාපාරය වසා දැමීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවලංගු කිරීමට නියමිතය.

## 2.2 මුදල් සැපයුම

| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2020 මැයි [අ] | මසකට පෙර | වසරකට පෙර [ආ] | 2020 මැයි [අ] | මසකට පෙර | වසරකට පෙර [ආ] |
| සංචිත මුදල් | 996.5 | 1,021.6 | 849.4 | 17.3 | 10.5 | (12.7) |
| පටු මුදල් සැපයුම ($M_1$) | 991.8 | 992.5 | 802.2 | 23.6 | 19.8 | 1.4 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 7,523.8 | 7,466.1 | 6,621.4 | 13.6 | 13.4 | 9.5 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 8,293.1 | 8,259.0 | 7,294.8 | 13.7 | 13.2 | 9.4 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් [ඇ] | (14.7) | 118.8 | 108.7 | (113.5) | 0.6 | 46.2 |
| මුදල් අධිකාරීන් | 817.8 | 949.1 | 779.3 | 4.9 | 23.1 | (3.9) |
| වාණිජ බැංකු | (832.5) | (830.3) | (670.5) | (24.2) | (27.1) | 9.0 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (394.1) | (402.7) | (280.6) | (40.4) | (50.1) | 14.3 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | (438.4) | (427.6) | (389.9) | (12.4) | (11.1) | 4.7 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් [ඇ] | 8,307.8 | 8,140.2 | 7,186.0 | 15.6 | 13.4 | 8.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 3,428.2 | 3,263.9 | 2,595.9 | 32.1 | 26.2 | 11.7 |
| මහ බැංකුව | 605.6 | 565.8 | 317.1 | 91.0 | 29.8 | 8.8 |
| වාණිජ බැංකු | 2,822.5 | 2,698.0 | 2,278.8 | 23.9 | 25.5 | 12.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 2,372.7 | 2,219.8 | 1,897.5 | 25.0 | 25.2 | 15.0 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 449.9 | 478.3 | 381.4 | 18.0 | 26.9 | (0.3) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 952.6 | 934.0 | 726.4 | 31.1 | 28.7 | 19.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 525.6 | 521.0 | 448.8 | 17.1 | 15.7 | 18.3 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 427.0 | 412.9 | 277.6 | 53.8 | 49.9 | 21.2 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 5,888.0 | 5,957.6 | 5,536.0 | 6.4 | 7.6 | 9.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 5,437.9 | 5,492.1 | 5,132.6 | 5.9 | 6.9 | 8.7 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 450.1 | 465.6 | 403.4 | 11.6 | 17.2 | 14.8 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (1,960.9) | (2,015.3) | (1,672.2) | (17.3) | (20.6) | (18.7) |

(අ) තාවකාලික (ආ) සංශෝධිත (ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව










## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2020 ජූලි 16 | 2020 ජූලි 09 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 876,753.95 | 874,292.25 | 2,461.69 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2020 ජූලි 13 | 2020 ජූලි 14 | 2020 ජූලි 15 | 2020 ජූලි 16 | 2020 ජූලි 17 |
|---|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 4.53 | 4.54 | 4.53 | 4.53 | 4.52 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 3,000 | 2,550 | 7,175 | 6,000 | 5,000 |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 4.55 | 4.55 | 4.56 | 4.55 | 4.55 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 16,928 | 10,449 | 22,170 | 18,336 | 21,541 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2020 ජූලි 13 | 2020 ජූලි 14 | 2020 ජූලි 15 | 2020 ජූලි 16 | 2020 ජූලි 17 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 296,928.59 | 296,928.59 | 296,928.59 | 296,928.59 | 292,127.45 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 296,734.93 | 296,838.48 | 296,911.35 | 297,046.53 | 292,478.04 |

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2020 ජූලි 13 | 2020 ජූලි 14 | 2020 ජූලි 15 | 2020 ජූලි 16 | 2020 ජූලි 17 |
|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පියවීමේ දිනය | | | | | |
| පරිණත වන දිනය | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| බරිත සාමාන්‍ය එලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 169.023 | 165.755 | 157.077 | 156.891 | 158.842 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 0.000 | 0.000 | 0.010 | 0.000 | 0.000 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | 169.023 | 165.755 | 157.067 | 156.891 | 158.842 |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | 169.023 | 165.755 | 157.067 | 156.891 | 158.842 |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | 2020<br>මැයි අවසානයට(ආ) | 2020<br>අප්‍රේල් අවසානයට | 2019<br>දෙසැ. අවසානයට |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 1,821,108 | 1,822,046 | 1,829,927 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 18,159 | 18,181 | 18,538 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,802,949 | 1,803,865 | 1,811,389 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 116,498 | 119,170 | 121,489 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 31,382 | 31,977 | 31,386 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 85,116 | 87,193 | 90,103 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික

## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු.බිලියන) | 2020<br>මැයි අවසානයට(ආ) | 2020<br>අප්‍රේල් අවසානයට | 2019<br>දෙසැ. අවසානයට |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) | 2.3 | 2.1 | 3.4 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.9 | 1.7 | 1.4 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික







## 2.9 කොටස් වෙළඳපොළ

| අයිතමය | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | 2020 ජූලි 10 දිනෙන් අවසන් වූ සතිය | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය<br>(1985 = 100) (ASPI) | 4,988.50 | 4,992.62 | 5,715.10 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය<br>(2004 = 1,000) (S&P SL20) | 2,153.50 | 2,140.19 | 2,762.00 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම(රු. මිලියන) | 1,034.38 | 1,535.87 | 2,857.30 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,329.46 | 2,331.38 | 2,693.30 |
| විදේශීය මිලදී ගැනීම්(රු. මිලියන) | 239.93 | 197.49 | 261.40 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 454.84 | 420.83 | 69.60 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (214.91) | (223.34) | 191.70 |

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2019 ජන.-අප්‍රේල් | 2020 ජන.-අප්‍රේල් (අ) |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **598.4** | **478.7** |
| ආදායම | 598.1 | 476.7 |
| බදු ආදායම | 551.5 | 408.5 |
| බදු නොවන | 46.6 | 68.2 |
| ප්‍රදාන | 0.3 | 2.0 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **961.9** | **930.9** |
| පුනරාවර්තන | 750.5 | 820.7 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 211.3 | 110.2 |

(අ) තාවකාලික




## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)

| ශීර්ෂය | 2019 වසර අවසානයට | 2020 අප්‍රේල් අවසානයට (අ) |
|---|---|---|
| **සමස්ත දේශීය ණය** | **6,629.1** | **7,217.7** |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 873.9 | 1,110.7 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 4,606.2 | 4,826.8 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 6,402.4 | 6,807.1 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 13,031.5 | 14,024.7 |

(අ) තාවකාලික




## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2020 ජූලි 15 දිනෙන් අවසන් වූ සතියට

| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ (අ) | | ද්විතීයික වෙළඳපොළ (ආ) | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | පසුගිය සතියේ සාමාන්‍යය |
| භාණ්ඩාගාර බිල්පත් | මාස 03 | 4.65% | 5.08% | 4.81% | 4.67% | 4.74% | 5.02% |
| | මාස 06 | 4.75% | 5.18% | 4.92% | 4.79% | 4.86% | 5.12% |
| | මාස 12 | 4.91% | 5.32% | 5.07% | 4.94% | 5.01% | 5.31% |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 5.40% | 5.25% | 5.33% | 5.63% |
| | < වසර 03 | 5.47% | - | 5.78% | 5.67% | 5.73% | 6.00% |
| | < වසර 05 | - | - | 6.46% | 6.35% | 6.41% | 6.58% |
| | < වසර 06 | 6.57% | - | 6.64% | 6.53% | 6.59% | 6.73% |
| | < වසර 08 | - | - | 6.79% | 6.68% | 6.74% | 6.98% |
| | < වසර 10 | - | - | 7.04% | 6.87% | 6.96% | 7.15% |
| | < වසර 15 | - | - | 7.28% | 7.05% | 7.17% | 7.39% |
| | < වසර 20 | - | - | 7.45% | 7.15% | 7.30% | 7.34% |
| | < වසර 30 | - | - | 7.92% | 7.56% | 7.74% | 7.70% |

(අ) 2020 ජූලි 15 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු

(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යන්‍ය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත්වල සහ වසර 30 ට වඩා අඩු කල්පිරීමක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර හැර අනෙකුත් භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික අඩු වී ඇත.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය | ද්විතීයික වෙළඳපොළ | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2020-ඔක්-04 | 6.250% | 34.62% | 25.35% |
| | 2021-ජූලි-27 | 6.250% | 18.44% | 15.35% |
| | 2022-ජන-18 | 5.750% | 19.09% | 16.05% |
| | 2022-ජූලි-25 | 5.875% | 18.26% | 16.26% |
| | 2023-අප්‍රේ-18 | 5.750% | 17.67% | 16.16% |
| | 2024-මාර්-14 | 6.850% | 16.99% | 15.35% |
| | 2024-ජූනි-28 | 6.350% | 15.73% | 14.40% |
| | 2025-ජූනි-03 | 6.125% | 15.33% | 14.14% |
| | 2025-නොවැ-03 | 6.850% | 15.58% | 14.39% |
| | 2026-ජූලි-18 | 6.825% | 15.13% | 14.12% |
| | 2027-මැයි-11 | 6.200% | 14.17% | 13.21% |
| | 2028-අප්‍රේ-18 | 6.750% | 14.15% | 13.20% |
| | 2029-මාර්-14 | 7.850% | 14.83% | 13.90% |
| | 2030-මාර්-28 | 7.550% | 14.28% | 13.39% |






## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2020 ජූලි 15 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,149,063.00 | 1,142,148.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර [අ] | 5,129,659.03 | 5,089,659.03 |
| **එකතුව** | **6,278,722.03** | **6,231,807.03** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 16,271.57 | 16,421.56 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 479,431.48 | 479,452.12 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය 0.91 ක ප්‍රතිශතයකින් අඩුවී ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 29,500.00 | 28,500.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 118,031.00 | 61,025.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 29,500.00 | 28,500.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 40,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 112,103.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 40,000.00 | - |

**මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 4.0 ගුණයක් හා භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය මෙන් 2.8 ගුණයක් ද විය.**

| ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 18,863.20 | 32,697.04 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 409,592.32 | 383,617.74 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 104,664.54 | 51,719.12 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 368,001.81 | 385,351.91 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළදී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 5.59 ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.**

(අ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද රු. මිලියන 56,662 ක් වන භාණ්ඩාගාර බැඳුම්කර ඇතුලත් වේ.

## 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) -2020 ජූලි 17

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.91 | 4.56 | 99.91 | 4.45 | 0.00 |
| මාස 1 | 99.62 | 4.59 | 99.63 | 4.49 | 0.01 |
| මාස 2 | 99.24 | 4.62 | 99.26 | 4.53 | 0.01 |
| මාස 3 | 98.86 | 4.65 | 98.88 | 4.54 | 0.03 |
| මාස 4 | 98.46 | 4.70 | 98.50 | 4.57 | 0.04 |
| මාස 5 | 98.07 | 4.71 | 98.12 | 4.58 | 0.06 |
| මාස 6 | 97.66 | 4.75 | 97.72 | 4.62 | 0.06 |
| මාස 7 | 97.24 | 4.79 | 97.32 | 4.65 | 0.08 |
| මාස 8 | 96.83 | 4.82 | 96.93 | 4.67 | 0.10 |
| මාස 9 | 96.42 | 4.84 | 96.52 | 4.70 | 0.10 |
| මාස 10 | 96.00 | 4.87 | 96.10 | 4.74 | 0.10 |
| මාස 11 | 95.58 | 4.89 | 95.71 | 4.75 | 0.13 |
| මාස 12 | 95.14 | 4.93 | 95.28 | 4.79 | 0.14 |

## 3.6 ද්වී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2020 ජූලි 17

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 06.20%2020A | 10 | 2020 අගෝ. 1 | 15 | 100.05 | 4.84 | 100.06 | 4.71 | 0.01 |
| 09.50%2020A | 5 | 2020 දෙසැ. 15 | 151 | 101.84 | 4.91 | 101.89 | 4.80 | 0.05 |
| 10.75%2021A | 5 | 2021 මාර්තු. 1 | 227 | 103.53 | 4.93 | 103.62 | 4.79 | 0.09 |
| 09.00%2021A | 8 | 2021 මැයි 1 | 288 | 103.05 | 5.00 | 103.16 | 4.86 | 0.11 |
| 11.00%2021A | 7 | 2021 අගෝ. 1 | 380 | 106.04 | 4.98 | 106.20 | 4.82 | 0.17 |
| 09.45%2021A | 7 | 2021 ඔක්. 15 | 455 | 105.16 | 5.11 | 105.36 | 4.95 | 0.20 |
| 11.50%2021A | 5 | 2021 දෙසැ. 15 | 516 | 108.59 | 5.11 | 108.89 | 4.90 | 0.30 |
| 08.00%2022A | 10 | 2022 ජන. 1 | 533 | 103.66 | 5.35 | 103.79 | 5.26 | 0.13 |
| 10.70%2022A | 3 | 2022 මාර්තු. 15 | 606 | 108.40 | 5.34 | 108.58 | 5.23 | 0.18 |
| 11.20%2022A | 9 | 2022 ජූලි 1 | 714 | 110.63 | 5.40 | 110.86 | 5.28 | 0.23 |
| 10.00%2022A | 8 | 2022 ඔක්. 1 | 806 | 109.41 | 5.41 | 109.67 | 5.29 | 0.26 |
| 07.90%2022A | 3 | 2022 දෙසැ. 15 | 881 | 105.59 | 5.40 | 105.77 | 5.32 | 0.19 |
| 08.65%2023A | 3 | 2023 ජන. 15 | 912 | 107.34 | 5.46 | 107.54 | 5.38 | 0.20 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු. 15 | 971 | 110.80 | 5.58 | 111.13 | 5.45 | 0.34 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 1,032 | 115.24 | 5.59 | 115.62 | 5.46 | 0.38 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 1,093 | 112.35 | 5.66 | 112.70 | 5.54 | 0.35 |
| 09.00%2023A | 10 | 2023 සැප්. 1 | 1,141 | 109.33 | 5.70 | 109.71 | 5.57 | 0.39 |
| 11.20%2023A | 9 | 2023 සැප්. 1 | 1,141 | 115.53 | 5.70 | 115.94 | 5.57 | 0.41 |
| 07.00%2023A | 20 | 2023 ඔක්. 1 | 1,171 | 103.57 | 5.76 | 103.96 | 5.63 | 0.39 |
| 11.60%2023A | 5 | 2023 දෙසැ. 15 | 1,246 | 117.71 | 5.80 | 118.14 | 5.68 | 0.42 |
| 11.40%2024A | 10 | 2024 ජන. 1 | 1,263 | 116.58 | 6.01 | 116.94 | 5.91 | 0.36 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු. 15 | 1,337 | 115.64 | 6.07 | 116.02 | 5.96 | 0.38 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 1,429 | 114.28 | 6.09 | 114.65 | 5.99 | 0.37 |
| 11.00%2024A | 8 | 2024 අගෝ. 1 | 1,476 | 117.17 | 6.14 | 117.66 | 6.01 | 0.49 |
| 09.85%2024A | 5 | 2024 සැප්. 15 | 1,521 | 113.61 | 6.10 | 113.92 | 6.02 | 0.31 |
| 06.00%2024A | 10 | 2024 දෙසැ. 1 | 1,598 | 99.17 | 6.22 | 99.59 | 6.11 | 0.41 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු. 15 | 1,702 | 115.43 | 6.37 | 115.99 | 6.24 | 0.57 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 1,749 | 110.87 | 6.33 | 111.27 | 6.24 | 0.41 |
| 11.00%2025A | 10 | 2025 අගෝ. 1 | 1,841 | 119.57 | 6.40 | 120.08 | 6.29 | 0.52 |
| 10.35%2025A | 8 | 2025 ඔක්. 15 | 1,916 | 117.18 | 6.44 | 117.71 | 6.33 | 0.54 |
| 09.00%2026A | 13 | 2026 පෙබ. 1 | 2,025 | 111.60 | 6.47 | 111.97 | 6.40 | 0.37 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු. 1 | 2,053 | 94.47 | 6.54 | 94.92 | 6.44 | 0.45 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 2,145 | 121.42 | 6.55 | 122.02 | 6.44 | 0.60 |
| 11.50%2026A | 10 | 2026 අගෝ. 1 | 2,206 | 124.37 | 6.55 | 124.98 | 6.44 | 0.61 |
| 11.40%2027A | 8 | 2027 ජන. 15 | 2,373 | 124.60 | 6.67 | 125.26 | 6.56 | 0.66 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 2,524 | 127.55 | 6.70 | 128.27 | 6.59 | 0.72 |
| 07.80%2027A | 7 | 2027 අගෝ. 15 | 2,585 | 106.18 | 6.69 | 106.77 | 6.59 | 0.59 |
| 10.30%2027A | 8 | 2027 ඔක්. 15 | 2,646 | 120.34 | 6.71 | 121.06 | 6.59 | 0.72 |
| 11.25%2027A | 10 | 2027 දෙසැ. 15 | 2,707 | 126.28 | 6.69 | 126.84 | 6.61 | 0.56 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු. 15 | 2,798 | 123.29 | 6.80 | 124.20 | 6.66 | 0.92 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 2,845 | 113.08 | 6.81 | 113.94 | 6.67 | 0.86 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 2,906 | 113.38 | 6.80 | 114.37 | 6.65 | 0.99 |
| 11.50%2028A | 13 | 2028 සැප්. 1 | 2,968 | 128.88 | 6.81 | 129.83 | 6.68 | 0.95 |
| 13.00%2029A | 15 | 2029 ජන. 1 | 3,090 | 137.67 | 7.02 | 139.11 | 6.83 | 1.44 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 3,210 | 139.21 | 6.96 | 140.70 | 6.78 | 1.49 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 3,589 | 128.00 | 7.01 | 129.67 | 6.81 | 1.67 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු. 15 | 3,893 | 130.30 | 7.14 | 131.92 | 6.96 | 1.62 |
| 08.00%2032A | 20 | 2032 ජන. 1 | 4,185 | 105.58 | 7.27 | 107.35 | 7.05 | 1.77 |
| 09.00%2032A | 20 | 2032 ඔක්. 1 | 4,459 | 113.62 | 7.29 | 115.68 | 7.06 | 2.06 |
| 11.20%2033A | 15 | 2033 ජන. 15 | 4,565 | 132.22 | 7.24 | 135.11 | 6.95 | 2.89 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 4,702 | 113.72 | 7.33 | 116.12 | 7.07 | 2.40 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 4,732 | 148.94 | 7.33 | 151.83 | 7.07 | 2.89 |
| 09.00%2033B | 20 | 2033 නොවැ. 1 | 4,855 | 113.95 | 7.34 | 116.31 | 7.08 | 2.36 |
| 13.25%2034A | 20 | 2034 ජන. 1 | 4,916 | 149.42 | 7.39 | 152.50 | 7.12 | 3.08 |
| 10.25%2034A | 15 | 2034 සැප්. 15 | 5,173 | 126.81 | 7.20 | 129.53 | 6.94 | 2.72 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු. 15 | 5,354 | 137.01 | 7.34 | 140.45 | 7.03 | 3.43 |
| 10.50%2039A | 20 | 2039 අගෝ. 15 | 6,968 | 131.41 | 7.40 | 135.55 | 7.08 | 4.14 |
| 12.00%2041A | 25 | 2041 ජන. 1 | 7,473 | 145.30 | 7.60 | 147.39 | 7.45 | 2.09 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 8,354 | 113.28 | 7.75 | 116.27 | 7.50 | 2.99 |
| 13.50%2044A | 30 | 2044 ජන. 1 | 8,568 | 159.36 | 7.90 | 164.94 | 7.55 | 5.58 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 8,720 | 156.63 | 8.10 | 164.53 | 7.60 | 7.90 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු. 1 | 8,993 | 144.45 | 8.25 | 152.62 | 7.70 | 8.16 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික

| අයිතමය | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)[අ] | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 183.49 | 188.09 | 185.79 | 185.80 | 175.56 |
| ස්ටර්ලිං පවුම් | 229.66 | 237.58 | 233.62 | 234.12 | 221.37 |
| ජපන් යෙන් | 1.70 | 1.77 | 1.73 | 1.74 | 1.62 |
| යුරෝ | 207.76 | 215.44 | 211.60 | 209.55 | 196.88 |
| ඉන්දියානු රුපියල්[1] | | | 2.47 | 2.47 | 2.56 |
| වි.ගැ.හි. ( 2020 ජූලි 16 දිනට ) | | | 257.78 | 257.47 | 243.04 |

| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් [ආ](එ.ජ. ඩොලර් මිලියන ) | 2020 ජූනි | මාසයකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මිලදී ගැනීම් | 69.00 | 61.50 | 87.50 |
| විකිණීම් | 9.25 | - | - |




| අයිතමය | 2020 ජූලි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 51.27 | 50.78 | 44.32 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) [2] | | | |
| මාස 1 | 185.86 | 185.87 | 176.20 |
| මාස 3 | 185.84 | 185.98 | 177.52 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 27.46 | 39.00 | 22.81 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) ( 2020 ජූලි 16 දිනට) | 1,757.94 | 1,740.55 | 1,963.65 |

(අ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව.9.30 ට පවතින)

(ආ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(1) මහ බැංකුවේ දෛනික විනිමය අනුපාතිකය (2) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය

## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

| අයිතමය | | 2019 ජූනි | 2020 ජූනි [අ] | 2019 ජන-ජූනි | 2020 ජන-ජූනි [අ] | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | 63,072 | _ | 1,008,449 | 507,311 | (49.7) |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 118.9 [ආ] | _ | 1900.7 [ආ] | 956.2 [ඇ] | (49.7) |
| | (රුපියල් බිලියන) | 21.0 [ආ] | _ | 339.5 [ආ] | 174.0 [ඇ] | (48.7) |
| | | 2019 මැයි | 2020 මැයි [අ] | 2019 ජන-මැයි | 2020 ජන-මැයි [අ] | % වෙනස |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ | (එ.ජ. ඩොලර් මිලියන) | 562.1 | 431.8 | 2,733.1 | 2,407.1 | (11.9) |
| ප්‍රේෂණ ලැබීම් | (රුපියල් බිලියන) | 99.2 | 81.1 | 486.7 | 445.7 | (8.4) |

(අ) තාවකාලික

(ආ) 2019 වසරේදී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත.

(ඇ) 2020 වසරේදී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය විය හැකිය.

සංචාරක පැමිණීම්




විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්



### 4.3 2020 ජූනි මස 30 දිනට නිල සංචිත වත්කම් (අ)

| | |
|---|---:|
| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | **6,693.2** |
| (1) විදේශ මුදල් සංචිත | 6,240.1 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65.8 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 2.6 |
| (4) රත්‍රන් | 383.6 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.0 |

(අ) තාවකාලික

### 4.4 2020 මැයි මස 29 දිනට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය (අ)

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---:|
| නිල සංචිත වත්කම් | **6,499.9** |
| (1) විදේශ මුදල් සංචිත | 6,057.9 |
| (අ) සුරැකුම්පත් | 4,524.2 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 1,533.6 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල වෙතින් | 796.8 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 1.1 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු වෙතින් | 735.7 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65.7 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 2.6 |
| (4) රත්‍රන් | 372.7 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1.0 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් (ආ) (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | එකතුව | කල්පිරීම | | |
|---|---:|---:|---:|---:|
| | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු | (5,522.6) | (350.7) | (783.1) | (4,388.8) |
| ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම | (3,980.9) | (282.3) | (571.4) | (3,127.2) |
| පොලිය | (1,541.7) | (68.4) | (211.7) | (1,261.6) |
| ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම | | | | |
| පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | (579.0) | | (62.0) | (462.0) |
| (i) හිඟ (–)(ඇ) | (694.0) | | (102.0) | (462.0) |
| (ii) අතිරික්ත (+) | 115.0 | | 40.0 | 0.0 |
| 3. අනෙකුත් | (0.1) | (0.1) | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | (0.1) | (0.1) | | |

(අ) තාවකාලික (ආ) මෙහි මූලික වශයෙන් අන්තර්ගත වන්නේ ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම්ය .
(ඇ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .

## 4.5 විදේශීය වෙළඳාම

| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2020(අ) ජන-මැයි | 2019 ජන-මැයි | % වෙනස | 2020(අ) ජන-මැයි | 2019 ජන-මැයි | % වෙනස |
| **අපනයන** | **3,518.7** | **4,915.3** | **(28.4)** | **647,941.3** | **876,360.7** | **(26.1)** |
| කෘෂිකාර්මික | 809.8 | 1,040.6 | (22.2) | 149,976.0 | 185,436.0 | (19.1) |
| කාර්මික | 2,695.8 | 3,853.2 | (30.0) | 495,569.4 | 687,101.8 | (27.9) |
| ආහාර, පාන හා දුම්කොළ | 156.1 | 202.3 | (22.8) | 28,848.1 | 36,131.9 | (20.2) |
| රෙදිපිළි හා ඇඟලුම් | 1,540.2 | 2,256.0 | (31.7) | 282,803.9 | 402,306.9 | (29.7) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 202.8 | 206.4 | (1.8) | 37,167.7 | 36,743.1 | 1.2 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 290.0 | 412.2 | (29.7) | 53,459.1 | 73,535.6 | (27.3) |
| වෙනත් | 506.7 | 776.2 | (34.7) | 93,290.4 | 138,384.3 | (32.6) |
| ඛනිජ අපනයන | 8.1 | 13.9 | (41.7) | 1,500.0 | 2,474.5 | (39.4) |
| වෙනත් අපනයන | 4.9 | 7.6 | (35.4) | 895.9 | 1,348.4 | (33.6) |
| **ආනයන** | **6,619.1** | **8,196.2** | **(19.2)** | **1,224,920.4** | **1,459,665.9** | **(16.1)** |
| පාරිභෝගික භාණ්ඩ | 1,533.0 | 1,552.9 | (1.3) | 284,363.7 | 276,499.7 | 2.8 |
| අන්තර් භාණ්ඩ | 3,602.0 | 4,703.8 | (23.4) | 665,917.4 | 837,804.8 | (20.5) |
| ආයෝජන භාණ්ඩ | 1,474.3 | 1,936.6 | (23.9) | 272,822.2 | 344,857.1 | (20.9) |
| වෙනත් | 9.9 | 2.8 | 247.4 | 1,817.2 | 504.4 | 260.3 |
| **වෙළඳ ශේෂය** | **(3,100.5)** | **(3,280.9)** | **-** | **(576,979.2)** | **(583,305.3)** | **-** |

(අ) තාවකාලික

ආනයන




අපනයන




වෙළඳ ද්‍රර්ශක (2010= 100 )




තේ මිල (වෙන්දේසි)




සහල් මිල (ආනයනික)




බොරතෙල් මිල (ආනයනික)




## 4.6 වෙළඳ ද්‍රර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2020 මැයි (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 81.7 | 39.3 | 133.8 |
| ප්‍රමාණය | 89.0 | 54.4 | 167.4 |
| ඒකක වටිනාකම | 91.7 | 72.2 | 79.9 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 88.7 | 100.5 | 159.6 |
| ප්‍රමාණය | 101.0 | 126.8 | 172.9 |
| ඒකක වටිනාකම | 87.9 | 79.3 | 92.3 |
| වෙළෙඳ මිල අනුපාතය | 104.4 | 91.1 | 86.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.7 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2020 (අ) මැයි | 2019 මැයි | % වෙනස | 2020 (අ) මැයි | 2019 මැයි | % වෙනස |
|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑම් 1ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1ක් රුපියල් | | |
| කොළඹ තේ වෙන්දේසි මිල | 3.75 | 3.05 | 23.00 | 705.00 | 538.32 | 30.96 |
| ආනයන (මි.ර.ගැ.) | මෙට්‍රික් ටොන් 1ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1ක් රුපියල් | | |
| සහල් | 653.53 | 462.09 | 41.43 | 122,774.86 | 81,533.18 | 50.58 |
| සීනි | 406.95 | 357.91 | 13.70 | 76,452.06 | 63,150.97 | 21.06 |
| තිරිඟු | 263.83 | 279.24 | (5.52) | 49,564.06 | 49,271.08 | 0.59 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් | 25.44 | 74.76 | (65.97) | 4,780.20 | 13,191.32 | (63.76) |

(අ) තාවකාලික